# 07 පාඩම
सप्तमः पाठः

# සර්වනාම වරනැඟීම

## 7.1 ක්‍රියාකාරකම

तत् / युष्मद् / अस्मद् ශබ්දවල ප්‍රථමා විභක්ති පද වාචෝද්ගත කරමු.

| पुरुष | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|
| प्रथमपुरुष | सः | तौ | ते |
| मध्यमपुरुष | त्वं | युवाम् | यूयम् |
| उत्तमपुरुष | अहं | आवाम् | वयम् |

## 7.2 ක්‍රියාකාරකම

ඉහත ශබ්දයන්හි ප්‍රථමා විභක්ති පදවල අර්ථ වාචෝද්ගත කරමු.

| | | | | | |
|---|---|---|---|---|---|
| सः | හෙතෙම/ඔහු/ඌ | तौ | ඔවුහු දෙදෙන | ते | ඔවුහු |
| त्वम् | තෝ/ඔබ/නුඹ | युवाम् | තොපි දෙදෙන | यूयम् | තොපි/නුඹලා |
| अहम् | මම | आवाम् | අපි දෙදෙන | वयम् | අපි |

## 7.3 ක්‍රියාකාරකම

මේ වාක්‍ය ඉගෙන ගන්න.

सः पुरुषः । හෙතෙම පුරුෂයෙකි. / ඒ පුරුෂයා

सः कुमारः । හෙතෙම කුමාරයෙකි. / ඒ කුමාරයා


නොමිලේ බෙදාහැරීම සඳහා ය.

| | |
|---|---|
| सः वृक्षः । | එය ගසෙකි. / ඒ ගස |
| सः शुनकः । | ඌ බල්ලෙකි. / ඒ බල්ලා |
| तौ पुरुषौ । | ඔවුහු දෙදෙන පුරුෂයෝ දෙදෙනෙකි.<br>ඒ පුරුෂයෝ දෙදෙන |
| तौ कुमारौ । | ඔවුහු දෙදෙන කුමාරවරු දෙදෙනෙකි.<br>ඒ කුමාරවරු දෙදෙන |
| तौ वृक्षौ । | ඒ දෙක ගස් දෙකකි. / ඒ ගස් දෙක |
| तौ शुनकौ । | උන් දෙදෙන බල්ලෝ දෙදෙනෙකි.<br>ඒ බල්ලෝ දෙදෙන |
| ते पुरुषाः । | ඔවුහු පුරුෂයෝ ය. / ඒ පුරුෂයෝ |
| ते कुमाराः । | ඔවුහු කුමාරවරු ය. / ඒ කුමාරවරු |
| ते वृक्षाः । | ඒවා ගස් ය. / ඒ ගස් |
| ते शुनकाः | ඒ බල්ලෝ ය. / ඒ බල්ලෝ |

## 7.1 අභ්‍යාසය

පහත සඳහන් සංස්කෘත වාක්‍ය සිංහලයට නඟන්න

१ सः बुद्धः । ..........................................

२ सः पुरुषः । ..........................................

३ सः गजः । ..........................................

४ सः देवः । ..........................................

५ सः बालकः । ..........................................

६ सः मूर्खः । ..........................................

७ सः वृषभः । ..........................................

८ सः काकः । ................................

९ सः शुकः । ................................

१० सः वृक्षः । ................................

## 7.2 අභ්‍යාසය

**පහත සඳහන් සිංහල වාක්‍ය සංස්කෘතයට නගන්න.**

1. ඔහු කුමාරයෙකි.
2. ඔහු සොරෙකි.
3. ඌ එළුවෙකි.
4. ඌ කපුටෙකි.
5. ඌ බල්ලෙකි.
6. ඒ පර්වතයකි.
7. ඔහු යෝධයෙකි.
8. ඌ ලේනෙකි.
9. ඔහු මිනිසෙකි.
10. එය ගසකි.

## 7.3 අභ්‍යාසය

**පහත සඳහන් සංස්කෘත වාක්‍ය සිංහලයට නගන්න.**

१ तौ बुद्धौ । ...............

२ तौ पुरुषौ । ...............

३ तौ गजौ । ...............

४ तौ देवौ । ...............

५ तौ बालकौ । ...............

६ तौ मूर्खौ । ...............

७ तौ वृषभौ । ...............

८ तौ काकौ । ...............

९ तौ शुकौ । ...............

१० तौ वृक्षौ । ...............

## 7.4 අභ්‍යාසය

**පහත සඳහන් සිංහල වාක්‍ය සංස්කෘතයට නඟන්න.**

1. ඔවුහු දෙදෙන කුමාරවරු දෙදෙනෙකි.
2. ඔවුහු දෙදෙන සොරු දෙදෙනෙකි.
3. ඒ දෙදෙන එළුවෝ දෙදෙනෙකි.
4. ඒ දෙදෙන කපුටෝ දෙදෙනෙකි.
5. ඔවුහු දෙදෙන අරක්කැමියෝ දෙදෙනෙකි.
6. ඔවුහු දෙදෙන පුරුෂයෝ දෙදෙනෙකි.
7. ඔවුහු දෙදෙන යෝධයෝ දෙදෙනෙකි.
8. ඒ දෙදෙන අශ්වයෝ දෙදෙනෙකි.
9. ඔවුහු දෙදෙන මිනිස්සු දෙදෙනෙකි.
10. ඒ දෙක ගස් දෙකකි.

## 7.5 අභ්‍යාසය

**පහත සඳහන් සංස්කෘත වාක්‍ය සිංහලයට නඟන්න.**

१ ते बुद्धाः। ....................................

२ ते पुरुषाः। ....................................

३ ते गजाः। ....................................

४ ते देवाः। ....................................

५ ते बालकाः। ....................................

६ ते मूर्खाः । .....................................

७ ते वृषभाः । .....................................

८ ते काकाः । .....................................

९ ते शुकाः । .....................................

१० ते वृक्षाः । .....................................

## 7.6 අභ්‍යාසය

**පහත සඳහන් සිංහල වාක්‍ය සංස්කෘතයට නගන්න.**

1. ඔවුහු කුමාරවරු ය.
2. ඔවුහු සොරු ය.
3. උන් එළුවෝ ය.
4. උන් කපුටෝ ය.
5. ඔවුහු අරක්කැමියෝ ය.
6. ඒවා පර්වතයෝ ය.
7. ඔවුහු යෝධයෝ ය.
8. ඔවුහු මෝඩයෝ ය.
9. ඔවුහු මිනිස්සු ය.
10. ඒවා ගස් ය.